# විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා, මරණීය දණ්ඩනයට එරෙහි හයවැනි ලෝක සමුළුවේ කළ ආරම්භක දේශනය

බහුල වශයෙන් භාවිතයට ගැනුණද, මරණීය දණ්ඩනය ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ දිගුකාලීන සමාජයීය ගැටළු මෙන්ම අසහනකාරී තත්ත්වයන් ඇතිකිරීමට හේතු වී ඇත. ඈත අතීතයේ පවා, කීර්තිමත් නායකයින් බොහො දෙනෙකු විසින් මරණීය දණ්ඩනය මානුෂීය අභිමානය කෙලෙසීමක් ලෙස හඳුනාගෙන ඇත. නිදසුනක් ලෙස, අතීත ශ්‍රී ලාංකික රජවරුන් බෞද්ධ ඉගැන්වීම අනුව යමින් මරණ දඬුවම අහෝසි කිරීමට පියවර ගෙන ඇත. හුදෙක්, පළමු, තෙවැනි, සිව්වැනි මෙන්ම දහතුන්වැනි සියවස් හි දී පවා ශ්‍රී ලංකාව තුළ මරණීය දඬුවම ක්‍රියාත්මක කොට නොමැත.

ශත වර්ෂයකට ආසන්න කාලයක් මුළුල්ලේ අපේ රටේ නීති සම්පාදකයින් අතර මරණීය දණ්ඩනය අවලංගු කළ යුතුයි යන ඒකමතික අදහස මර්ධනය වීමට ඉහත කාරණය හේතුවන්නට ඇතැයි සැළකිය හැකිය. මෙම ඒකමතිකභාවය මූලික වශයෙන් සදාචාරාත්මක කරුණු මත මෙන්ම නිවාරකයක් ලෙස මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේ හරසුන්භාවය මත ද පදනම් විය. ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මෙන්ම රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙන් එකක් වන එක්සත් ජාතික පක්ෂයේ පුරෝගාමියා වූ ඩී.එස්. සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් 1928 තරම් අතීතයේ රැස් වූ ලංකා ව්‍යවස්ථාදායක සභාවේ දී මරණීය දණ්ඩනය අහෝසි කිරීම් වෙනුවෙන් වූ යෝජනාවලියක් 19 කට 7ක් වශයෙන් වැඩි ඡන්දයෙන් සම්මත විය. එහෙත් යටත් විජිත පාලකයන්ගේ බලපුළුවන්කාරකම් හමුවේ එම අවලංගු කිරීමේ යෝජනාව නිෂ්ප්‍රභා කෙරිණි.

නිදහසින් වසර කිහිපයකට පසු, 1956 දී එවකට අධිකරණ කටයුතු පිළිබද පාර්ලිමේන්තු ලේකම් ලෙස කටයුතු කළ මාගේ පියා, එවකට ශ්‍රී ලංකාවේ වූත් අග්‍රාමාත්‍ය දිවයිනේ අනෙක් ප්‍රධාන දේශපාලන පක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුරෝගාමියා වූත්, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ සහයෝගය ඇතිව මරණ දඬුවම අහෝසි කිරීම සදහා පනතක් යෝජනා කළේය. මෙම පනත සම්මත වූ නමුදු ඊට වසර කිහිපයකට පසු බණ්ඩාරනායක මහතා ඝාතනය වීමත් සමග යළි ක්‍රියාත්මක වූ මරණීය දණ්ඩනය යළි ක්‍රියාත්මක වූ අතර, 1976 දී එය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කෙරිණි.

වර්තමාන පාර්ලිමේන්තුව තුළ සිටින මාගේ මිත්‍රයින් බහුතරයකගේ ද මතය වන්නේ මරණීය දණ්ඩනය සදාචාරාත්මක වශයෙන් අනනුරූපි බවත් එය අසාර්ථක බවත්ය. කෙසේ වෙතත්, කරුණු කාරණා නිසි ආකාරයෙන් නොදත් මහජනයාගේ විරෝධය හමුවේ, 1956 දී ආණ්ඩුව ගත් දැඩි පිළිවෙත ඉදිරියට ගෙන යාමට ඔවුන් අපොහොසත් වී ඇත. ඒ සදහා ඔවුන් දක්වන බිය ශ්‍රී ලාංකික නීතිසම්පාදකයින්ට හෝ ජූරි සභිකයින්ට පමණක් සීමා වූවක් නොව මරණීය දණ්ඩනය මෙතෙක් අවලංගුකොට නොමැති අනෙකුත් ආසියානු රටවලට ද පොදු වූ කාරණයක් බව මාගේ විශ්වාසයයි.

ඒ අනුව, අද අප මුහුණ දී ඇති පොදු අභියෝගය වන්නේ අපගේ ජනතාවට එය ඒත්තු ගැන්වීමයි. ඇතැම්විට වඩාත් වැදගත් විය හැක්කේ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වෙමින් ඊට නායකත්වය ලබාදීමට සාමුහික ධෛර්යයක් තිබීමයි.

කෙසේ වුවද, මහජන මතය වෙනස් කිරීම කාලය ගත වන හා සම්පත් වැයවන ක්‍රියාවලියකි. එමෙන්ම, දිගින් දිගටම ඒ පිළිබඳ සාකච්ඡා පැවතුන ද, බොහෝ රටවල මරණීය දණ්ඩනය යන මාතෘකාව සම්බන්ධයෙන් වූ මහජන මතය සාපේක්ෂව වෙනස් කළ නොහැකි තත්ත්වයක පවතින බව සාක්ෂි මගින් පෙනී යයි. එහෙයින් මෙම ප්‍රධාන අභියෝගය ජය ගැනීම සඳහා දේශපාලනික මැදිහත්වීමක් අවශ්‍යය. සමීක්ෂණයක ආකාරයෙන් පුද්ගලයන් වෙත ප්‍රශ්න ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීමේ දී මෙන් නොව පුද්ගලයන්ට ආදේශක නඩු විභාගයකට සහභාගීවීමට අවස්ථාව ලබා දුන් විට, ඉතා බරපතළ සිද්ධිවල දී පවා මරණීය දණ්ඩනයට සහාය පළකළ පිරිස 30% ක් වත් නොවන බව අධ්‍යයනවලින් හෙළි වී ඇත. 1981 දී ප්‍රංශයේ දී මරණීය දණ්ඩනයට පක්ෂව අති විශාල මහජන මතයක් ගොඩනැගී තිබුණද, එකළ ප්‍රංශ ජනපති විසින් මරණීය දණ්ඩනය අහෝසි කිරීමට ගත් තීරණය හේතුවෙන් මහජන මතයේ ද වෙනස්වීමක් සිදුවිය. මරණීය දණ්ඩනය අහෝසි කිරීමේ ක්‍රියාවලිය හේතුකොට ගෙන පැනනගින තර්කයන් හා මරණ දඬුවම අහෝසි කිරීමෙන් පසුව ද අපරාධ ප්‍රමාණයේ වෙනසක් සිදු නොවීම මගින් ජනතාව තුළ පවතින සැක බිය අඩුවන බව පැහැදිලි කරුණකි. ඒ අනුව, මරණීය දණ්ඩනය අහෝසි කිරීමෙන් පසුව ද පරිවර්තනයට ලක් වූ සිද්ධීන් ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි.

සෙසු ලෝකය හා සසඳන කළ, මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීමේ වැඩි ප්‍රවණතාවක් ආසියාව තුළ ක්‍රමයෙන් ගොඩනැගෙමින් පවතී. ගිණිකොන දිග ආසියාව තුළ මරණීය දණ්ඩනය ක්‍රියාත්මකකළ අවස්ථා ගණන සැළකිය යුතු ලෙස අඩු

වී ඇති අතර, දකුණු ආසියාව තුළ මරණ දඬුවම කෙටි කාලීන හා දිගු කාලීන තාවකාලික වශයෙන් අත්හිටුවීමකට ලක්කොට ඇත.

2007 දී, ආසියානු රටවල් 24ක් මරණ දඬුවම අත්හිටුවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාවලියට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ අතර, 2014 දී එම සංඛ්‍යාව 18 දක්වා අව ප්‍රමාණය විය. තවත් හොඳ ප්‍රවෘත්තියක් ද තිබේ. එනම්, මෙම සමුළුවේ දී සැසියක් ඇමතීමට නියමිත ශ්‍රී ලංකාවේ අධිකරණ අමාත්‍යවරයා, 2007, 2008 හා 2010 වර්ෂවලදී සිදු කළ පරිදි ශ්‍රී ලංකාව මෙම යෝජනාවලියට පක්ෂව ඡන්දය ලබාදීමේ සාම්ප්‍රදායික ස්ථාවරයට නැවතත් එළඹෙන බවත්, දශක හතරක් මුළුල්ලේ ක්‍රියාත්මක කළ පරිදි මරණ දඬුවම තත්වාකාරයෙන් අත්හිටුවීමේ ක්‍රියාමාර්ගය ඉදිරියටත් අනුගමනය කරන බවත් පාර්ලිමේන්තුව වෙත දැනුම් දී තිබීමයි.

මරණීය දණ්ඩනය අහෝසි කිරීම සඳහා ජනතාවට ඒත්තු ගැන්වීම හා නොසැලෙන අධිෂ්ඨානය අවශ්‍ය බවත්, ඒ සියල්ලටම වඩා නීති සම්පාදකයන්ගේ, ක්‍රියාකාරීන්ගේ, සංස්කාරකවරුන්ගේ, අධ්‍යාපනවේදීන්ගේ හා ජූරි සභිකයන්ගේ සාමූහික නායකත්වය අවශ්‍ය බවත් පවසමින් මම මේ කථාව අවසන් කරමි. ප්‍රගතිශීලී මහජන මතයක් ගොඩනැගීමත් සමග, ඉදිරි වර්ෂවලදී අපගේ කලාපය තුළ ද මරණීය දණ්ඩනයේ අවසානයක් දකින්නට ලැබෙනු ඇතැයි මාගේ විශ්වාසයයි.